# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

**පාලි - PALI - E 3025**

**පාලි පිටකගත දර්ශනය, ආචාර ධර්ම හා මූලාශ්‍රය අධ්‍යයනය**

**කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

I - කොටස

01. සත්ත්වයාගේ ස්වාභාවය පිළිබඳ ආදි බෞද්ධ ඉගැන්වීම් අදාළ සූත්‍ර දේශනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමේ සුවිශේෂතා පැහැදිලි කර, ඒවා බුද්ධකාලීන සමයාන්තර කර්ම සංකල්පයන් සමග තුලනය කරන්න.

03. බෞද්ධ භාවනාව එහි අරමුණ හා අභිමතාර්ථ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් විස්තර කරන්න.

04. වර්තමාන සංකීර්ණ සමාජ ගැටලු විසඳීම විෂයෙහි බෞද්ධ පඤ්චශීල ප්‍රතිපදාව කෙතෙක් දුරට උපයෝගීකොට ගතහැකි දැයි සාකච්ඡා කරන්න.

05. අධ්‍යාත්මික ප්‍රගතිය විෂයෙහි ආචාර ධර්ම උපස්තම්භක වන අයුරු මූලාශ්‍රයානුසාරයෙන් පැහැදිලි කරන්න.

06. පරිසර සංවේදීතාව පිළිබිඹු කරන බෞද්ධ ඉගැන්වීම් හඳුන්වා, එහි සමකාලීන උපයෝගීතාව පෙන්වා දෙන්න.

## II - කොටස

07. පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

''කතමස්ස චත්තාරො කම්මකිලෙසා පහීනා හොන්ති? පාණාතිපාතො ඛො, ගහපතිපුත්ත, කම්මකිලෙසො, අදින්නාදානං කම්මකිලෙසො, කාමෙසුමිච්ඡාචාරො කම්මකිලෙසො, මුසාවාදො කම්මකිලෙසො. ඉමස්ස චත්තාරො කම්මකිලෙසා පහීනා හොන්ති''ති. ඉදමවොච භගවා, ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා

''පාණාතිපාතො අදින්නාදානං - මුසාවාදො ච වුච්චති;
පරදාරගමනඤ්චෙව - නප්පසංසන්ති පණ්ඩිතා''ති.

''කතමෙහි චතූහි ඨානෙහි පාපකම්මං න කරොති? ඡන්දාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති, දොසාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති, මොහාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති, භයාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති. යතො ඛො, ගහපතිපුත්ත, අරියසාවකො නෙව ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති; ඉමෙහි චතූහි ඨානෙහි පාපකම්මං න කරොතී''ති. ඉදමවොච භගවා, ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා –

''ඡන්දා දොසා භයා මොහා - යො ධම්මං අතිවත්තති;
නිහීයති යසො තස්ස - කාළපක්ඛෙව චන්දිමා.

''ඡන්දා දොසා භයා මොහා - යො ධම්මං නාතිවත්තති;
ආපූරති යසො තස්ස - සුක්කපක්ඛෙව චන්දිමා''ති.

''කතමානි ඡ භොගානං අපායමුඛානි න සෙවති? සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගො ඛො, ගහපතිපුත්ත, භොගානං අපායමුඛං, විකාලවිසිඛාචරියානුයොගො භොගානං අපායමුඛං, සමජ්ජාභිචරණං භොගානං අපායමුඛං, ජූතප්පමාදට්ඨානානුයොගො භොගානං අපායමුඛං, පාපමිත්තානුයොගො භොගානං අපායමුඛං, ආලස්‍යානුයොගො භොගානං අපායමුඛං.

08. පහත සඳහන් ඡේදයට සිංහලානුවාදයක් සපයන්න.

*Theravādin.*—You say that 'all' exists. Hereby you are involved in these further admissions :—

All exists everywhere, at all times, in every way, in all things, not in a combined state, the non-existent exists, the right view which looks upon your wrong view as wrong exists.

Again, taking all in terms of time, you affirm that the past exists, the future exists, the present exists. But is not the past [something that has] ceased—that is, departed, changed, gone away, gone utterly away? How then can you say 'the past exists'? Again, is not the future [something that is] not yet born, not yet come to be, not yet come to pass, has not happened, not befallen, is not manifested? How then can you say 'the future exists'?

The present, you say, exists; and the present is [something that has as yet] not ceased, not departed, not changed, not gone away, not utterly gone away. And the past, you say, 'exists'; then you should say of the past also that it has not ceased, not departed, and so on.

*******************